**හින්දු සංස්කෘතික අරමුදල - 2017**

**-----------------------------------------**

හින්දු සංස්කෘතික අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, ලැබීම් හා ගෙවීම් ගිණුම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
-------------------

### 2.1 මතය
------
මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හින්දු සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------------
2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1(ඇ) ඡේදය අනුව අයවැය ලේඛනයක් සකස් කර අනුමත කර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛණයක් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය
-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------
ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,586,304 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,428,489 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,157,815 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පඩුරු මුදල් එකතු කිරීමේ ව්‍යාපෘතියේ ආදායම රු.4,062,111 කින් හා වැඩසටහනක් පැවැත්වීමෙන් රු.1,803,090 ක ශුද්ධ ආදායමක් උපයාගෙන තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ අරමුණු හා පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය අරමුදල් රැස්කිරීමට ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක කර තිබූ අතර, එම ව්‍යාපෘති වලින් සහ ස්ථාවර තැන්පතු මගින් සමාලෝචිත වර්ෂයේදී රු.12,969,731 ක ආදායමක් උපයා තිබුණද ඉන් උපයෝජනය කර තිබුණේ රු.6,778,434 ක් පමණක් වීමෙන් උපයෝජනය නොකළ ප්‍රමාණය රු.6,191297 ක් හෙවත් රැස්කළ ආදායමෙන් සියයට 48 ක් විය.

(ආ) හින්දු ජනතාව සඳහා ආගමික පොත්ද, “අරනෙරි”පාසැල් ළමුන් සඳහා උපකාරක පොත්ද මිලදී ගෙන බෙදාහැරීමට සැලසුම් කර තිබුණද, රු.1,319,750 කට සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ එම පොත් තොගයෙන් වටිනාකම රු.830,162 ක් පිරිවැය වූ පොත් විගණන අවස්ථාව වූ 2018 මැයි මාසය වනවිටත් බෙදාහැර නොතිබුණි.

(ඇ) අරනෙරි පාසැල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් බෙදාදීම සඳහා රු.2,200,000 ක් වැය කර සාරි 2000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබුණි. එයින් පිරිවැය රු.1,430,000 ක්වූ සාරි 1300 ක් විගණන අවස්ථාව වූ 2018 මැයි මාසය වන විටද බෙදාහැර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සම්බන්ධයෙන් වරින්වර අරමුදලේ සභාපති වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) තොග පාලනය | අරමුදල මගින් මිලදී ගෙන තිබූ නිල ඇඳුම් සහ පොත් නිසි කාලය තුළ අදාළ පුද්ගලයන් වෙත බෙදා නොහැරීම. |
| (ආ) අයවැයකරණය | අරමුදලේ ආදායම හා වියදම සාධාරණ පරිදි පුරෝකතනය කර අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබීම. |